CPA

CENTRE FOR POLICY ALTERNATIVES

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# හදිසි අවස්ථා තත්ත්වය අවසන් කිරීම පිළිබඳව වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

***2011 අගෝස්තු 27, වනදා කොළඹ, ශ්‍රී ලංකාව*** : සැප්තැම්බරයේදී නීතියේ ක්‍රියාකාරිත්වය තුළින් හදිසි නීති තත්ත්වය අවලංගුවන විට එහි දීර්ඝ කිරීමක් සිදුකිරීමට රජය බලාපොරොත්තු නොවන බවට 2011 අගෝස්තු 25වන දින ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතුටට පත්වෙයි. 2009 වසරේ සිදුවූ යුද්ධය අවසන් වීමේ සිටම හදිසි තත්ත්වය කඩිනමින් අවසන් කිරීම සිවිල් සමාජයේ සැලකිල්ල යොමු වූ ප්‍රධාන කරුණක් විය. පරම්පරාවක ශ්‍රී ලාංකිකයන් හට හදිසි තත්ත්වය ව්‍යතිරේකයක් නොව සම්මතයක්ම වාගේ වූ අතර එය ප්‍රජාතන්ත්‍රවාදය, රාජ්‍යකරණය හා නිදහස භුක්ති විඳීම කෙරෙහි ඇති කළේ දුබල කරවන සුළු බලපෑමකි.

1970 ගණන් වල සිට රාජ්‍යයේ බලඅධිකාරිය වෙත වූ ආයතන වලින් පරිබාහිර හා සන්නද්ධ අභියෝගයන් බවට වර්ධනය වූ ගැඹුරට මුල් විහිදුනු දේශපාලන ප්‍රශ්නයන් පිළිබඳව සිහිපත් කිරීම මෙහිලා කාලෝචිත වෙයි. මෙම ප්‍රශ්න විසින් මෙකී බලතල දීර්ඝ කාලීන ලෙස භාවිත කිරීමේ අවශ්‍යතාවය නිර්මාණය කරන ලදී. ත්‍රස්තවාදය හා අනෙකුත් එවැනි ප්‍රචණ්ඩ ක්‍රමවේදයන් සහමුලින්ම හෙළා දැකිය යුතු වන අතරම ඒවාට තුඩු දුන් හේතූන්ගේ සන්ධර්භය තුළ ඒවා අවබෝධ කරගැනීමද වැදගත්ය. එමෙන්ම පශ්චාත් යුද ශ්‍රී ලංකාවේ වඩා සාධාරණ බලය බෙදා හදා ගැනීමක් තුළින් සහ නීතියේ ආධිපත්‍යය යටතේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම තුළින් සාමය, ඒකාබද්ධතාවය සහ විවිධත්වය සාක්ෂාත්කර ගැනීමේ දේශපාලන අභියෝගයන් ජයගැනීම තවමත් අප විසින් කළ යුතුව තිබෙන්නක්ව ඇත. රාජ්‍යයේ ප්‍රජාතාන්ත්‍රික සුජාතභාවය හා ඍජුවම සම්බන්ධවූ මෙම යටින් දිවෙන ප්‍රශ්ණයන් හට පිලියම් නොයෙදුවහොත් හදිසි තත්ත්වයන් නැවත ප්‍රකාශයට පත්කිරීම අවශ්‍ය කරවන්නාවූ ආකාරයේ ගැටුම් නැවත ඇතිවිය හැකි බව අපගේ දැඩි විශ්වාසයයි. එබැවින් හදිසි නීති තත්ත්වය අවසන් කිරීමේ සාධනීය පැතිමානයන් පුළුල් ඓතිහාසික, දේශපාලනික හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සන්ධර්භයක් තුළ සලකා බැලිය යුතුව ඇත. අවසන්වූ ගැටුමට තුඩුදුන් හේතූන් අනාගතයේදී පුනර්ජනනය නොවනබවට සහතික කළ හැකි නව පශ්චාත් යුද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විසඳුමකට එළැඹීමේ හදිසි අවශ්‍යතාවය මෙහිලා විශේෂයෙන්ම වැදගත් වේ. මෙම ප්‍රධාන අභියෝගය වෙත අවංකත්වයෙන්, උදාර ත්‍යාගශීලීත්වයෙන් හා අරමුණෙහි ගැඹුරු හා බරපතල කැපවීමෙන් යුතුව ප්‍රවේශවන ලෙස අප රජයෙන් ඉල්ලා සිටින අතර එහිදී ශ්‍රී ලාංකීය බහුත්ව සමාජය පිළිබඳව මෙතෙක් තම උත්සාහයන්හිදී දැක්වූවාට වඩා සංවේදී අවබෝධයකින් යුතුව රජය ක්‍රියාකරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

පසුගිය දශක හතර තුළ අප අත්විඳි හදිසි අවස්ථා හා ත්‍රස්තවිරෝධී බලතල හා සම්බන්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය හා නෛතික පාදක ව්‍යූහයේ පවතින බරපතල ඌණතාවයන් පිළිබඳව නැවත පරීක්ෂාවක් හා තක්සේරුවක් හදිසි අවස්ථා තත්ත්වයේ සිදුවන මෙම ලිහිල්වීම මඟින් අවස්ථාවක් සැපයේ. හදිසි අවස්ථා බලතලයන් හී වත්මන් ක්‍රියාපටිපාටිමය හා ස්ථාවර පාදක ව්‍යූහයන් පදනම්ව ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIII පරිච්ඡේදයේ හා මහජන ආරක්ෂක ආඥා පනතෙහිය. මෙම පාදක ව්‍යූහයේ අංගයන් ගණනාවක්ම ප්‍රජාතන්ත්‍රවාදයෙහි හා නීතියේ ආධිපත්‍යයෙහි වත්මන් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා ප්‍රධාන මූලධර්මයන් සැපිරීමට අසමත්වෙයි. හදිසි තත්ත්වයේ නිර්වචනය කොට නොමැති ස්වභාවය, හදිසි තත්ත්වයක් ප්‍රකාශ කිරීම සඳහා නෛතිකව ස්ථාපනය කරන ලද පූර්ව කොන්දේසීන් නොමැතිවීම, හදිසි අවස්ථා තීරණ ගැනීම් හා විධායක ක්‍රියාවන්හී පැතිමානයන් ගණනාවක් කෙරෙහිම වූ අධිකරණමය අධීක්ෂණය සඳහා වූ ඉඩකඩ වලක්වා තිබීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර අනෙක් සියලු නීතීන් අභිභවා යන හදිසි අවස්ථා රෙගුලාසීන් ඇතුළු හදිසි අවස්ථා බලතල ක්‍රියාත්මක කිරීම කෙරෙහී වන ''සමානුපාතිකබව'' වැනි ව්‍යවස්ථානුකුල ස්ථාවර පාලනයන් නොමැතිවීම, හදිසි අවස්ථාව දීර්ඝ කිරීම සඳහා වූ ක්‍රියාපටිපාටියේ දුර්වලකම් සහ පාර්ලිමේන්තු සහ අධිකරණමය අධීක්ෂණයෙහි පවත්නා සමස්තයක් ලෙසමවූ අසමත්බව, ප්‍රජාතාන්ත්‍රික ප්‍රමිතීන්ට අනුකූලවූ ප්‍රමාණවත් ආරක්ෂණ උපයෝගයන්ගෙන් තොරව මූලික අයිතිවාසිකම්

සීමා කිරීමට ඉඩකඩ සලසන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අයිතිවාසිකම් පරිච්ඡේදයෙහි දුර්වලතාවයන් යනාදිය මීට ඇතුළත්වෙයි. නෛතික හදිසි අවස්ථා බලතල ශ්‍රේණිය හා සම්බන්ධවූ මේ සුවිශේෂී ඌණතාවයන් වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි හා රාජ්‍යකරණ සංස්කෘතියෙහි පුළුල් සන්දර්භය තුළ අවබෝධ කරගත යුතුව ඇත.

එහිදී බලතල බෙදීම සහ සංවරණ හා තුළණ ක්‍රමෝපායයන් සීමාවන්ට ලක්වන පරිදි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අතිශය ප්‍රමුඛතාවයක් විධායක ජනාධිපතිධුරයට හිමිකොට දී ඇති බව සැළකිල්ලට ගතයුතු වේ. සියලු පාලන කාලයන් හී සිටි පාර්ලිමේන්තු විපක්ෂයන් ද තම සුපරීක්ෂණයේ සහ වගවීම සහතික කර ගැනීමේ භූමිකාවන් හීදී ඵලදායක ලෙස ක්‍රියාත්මක වීමට අසමත්ව ඇති බව හා එය නියාමන පාදකව්‍යුහය ක්‍රමාණුකූල විනාශයකට ලක්වීමට තුඩුදී ඇති බවද කිවයුතුව ඇත.

මීට අමතරව, පැනවූ දා පටන්ම මර්ධනයේ උපකරණයක් වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත දිගින් දිගටම බලපවත්වමින් ක්‍රියාත්මක වේ. එහි දීර්ඝ වන්නාවූ රඳවා ගැනීම් හා සාක්ෂිවල පිළිගත හැකි බව පිළිබඳව වූ විධිවිධානයන් තුළින් සාපරාධී වගකීම් සම්බන්ධයෙන් පුද්ගලයෙකු හට ලැබෙන ක්‍රියාපටිපාටිමය ආරක්ෂාව පිළිබඳව වූ මූලික ප්‍රමිතීන් පවා සපුරාලීමට අසමත් වෙයි. එපමණක් නොව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇතුළු අනෙකුත් ප්‍රජාතාන්ත්‍රික නිදහසවල් ගණනාවකට පැනවෙන සීමාවන් එමගින් බලගැන්වේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් ශ්‍රී ලංකාවේ වධහිංසා පැමිණවීම සහ අනෙකුත් අපයෝජනයන් හට සෘජුවම ඉඩකඩ සැළසෙන බව නිරීක්ෂණ මත පදනම්ව තහවුරු කරනු ලැබ ඇත. ප්‍රජාතාන්ත්‍රික සමාජයක ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පැවතීමට කිසිඳු ඉඩකඩක් නොමැත. එය අහෝසි කොට ඒ වෙනුවට ත්‍රස්තවිරෝධී බලතල හා අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අගයයන් ඇතුළු පිළිගත් ස්ථාවර ප්‍රමිතීන් හා අනුකූලවන ප්‍රජාතාන්ත්‍රික නිදහසවල් සමතුළිතව පවත්නා ව්‍යවස්ථාවන් පැනවීමට ක්‍රියාකරන ලෙස වූ තම ඉල්ලීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවත ඉදිරිපත් කර සිටී.

දිගින් දිගටම සිදුවූ හදිසි අවස්ථා තත්ත්වය දීර්ඝ වෙමින් පසුගිය දශක හතරක කාලය තුළ විශාල කාල පරිච්ඡේදයන් පුරා පැවතීම මෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා හදිසි අවස්ථා රෙගුලාසි වෙත පුළුල් ලෙස යොමු වීමේ අවශ්‍යතාවය ඇති කළ ගැටුම් තත්ත්වයන් විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍යකරණයේ සංස්කෘතිය හා භාවිතයන් වෙත පුළුල් බලපෑමක් ඇති කොට ඇත. සුවිශේෂ බලතල යටතේ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි ප්‍රධාන වැදගත්කමක් උසුලන නෛතික සීමාකාරී උපක්‍රමයන්ගෙන් තොරව සිදුවන පාලනයට හුරු පුරුදු වී ඇත්තේ විධායකය පමණක්ම නොවේ. පාර්ලිමේන්තුව, අධිකරණයන් හා සමස්ථයක් ලෙස ගත්කළ මුළු සමාජයම එවැනි පාලනයකට හුරු වී ඇත. අපට සතුටු විය හැකි හදිසි අවස්ථා තත්ත්වය ලිහිල් කිරීම සිදුවී තිබියදී වුවද අපගේ රාජ්‍යකරණ සංස්කෘතිය වඩා ප්‍රජාතන්ත්‍රික මාදිලියක් වෙත නැවත යොමු කිරීම සඳහා දිගින් දිගටම වූ කැපවීමක් අවශ්‍යවේ. එසේ වුවද අවාසනාවකට මෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනය, යුද්ධයට පසු සිදුවූ විශේෂයෙන් උතුරු නැගෙනහිර පළාත්වල සිවිල් ජන ජීවිතය හා සිවිල් පරිපාලනය වෙත සන්නද්ධ හමුදාවන්ගේ භූමිකාව හා සංස්ථාගත ආරක්ෂක බල ව්‍යුහයන් ව්‍යාප්ත කිරීම යනාදී රජයේ පියවරයන් මගින් ඒ පිළිබඳව බලපතළ සැකසංකා ජනනය කරනු ලැබ ඇති අතර ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශයේ සිත්ගන්නාසුළු බව බොරු කිරීමක්ද එමගින් සිදුවේ.

මේ දක්වා හදිසි අවස්ථා රෙගුලාසි මගින් පාලනය වූ හා එබැවින්ම හදිසි අවස්ථාව ඉකුත් වීමත් සමඟම භාවිතය අවලංගු වන විෂයයන් හා කරුණු සම්බන්ධයෙන් රජය විසින් යෙදීමට බලාපොරොත්තු වන විකල්ප විධිවිධානයන් මොනවාද යන්න පිළිබඳව වන විස්තර ජනාධිපතිවරයාගේ පාර්ලිමේන්තු ප්‍රකාශයේ ඇතුළත් නොවූ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සැළකිල්ලට යොමුව ඇත. 'යටත් වූ එල්.ටී.ටී. සාමාජිකයන්' යැයි කියනු ලබන අය රඳවා තබා ගැනීම, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා වන කාර්ය රාමුව, තවමත් පවත්නා අධි ආරක්ෂිත කලාපයන් පිළිබඳව පැන නගින කරුණු සහ වෙනත් කරුණු මීට ඇතුළත් වේ. පශ්චාත් යුද සමගිසන්ධානය කෙරෙහි මෙවැනි කරුණු ගණනාවක් මගින් ඇති කරන වක්‍ර බලපෑම් නිසා රජය විසින් ගැනීමට අදහස් කරන පියවරයන් ප්‍රසිද්ධ කරනු ලැබීම අත්‍යවශ්‍ය වේ. පොදු වශයෙන් ගත්කළ අප රජයෙන් ඉල්ලා සිටින්නේ අනාගතයේදී ජාතික ආරක්ෂාව හා ත්‍රස්තවාදය සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඒමට අදහස් කරන නීති හා ව්‍යවස්ථාවන් පිළිබඳව වඩා විනිවිද පෙනෙන සුළු හා අදාළ පාර්ශවයන්ගෙන් විමසන ප්‍රවේශයක් අනුගමනය කරන ලෙසය.

කළයුතුව තිබුණාට වඩා විශාල කාලයක් ගතවී හෝ මෙසේ හදිසි නීති තත්ත්වය අවසන් කිරීම පිළිබඳව සතුටු වෙමින් වුවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වශයෙන් අප නැවතත් ප්‍රකාශ කොට සිටින්නේ අත්‍යවශ්‍ය නෛතික හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන් සිදුකිරීම සඳහා රජයේ පැත්තෙන් වන අඛණ්ඩ කැපවීමක තීරණාත්මක අවශ්‍යතාවයක් පවතින බවයි. ආර්ථික සංවර්ධනය පිළිබඳව වූ රජයේ ප්‍රමුඛතාවයන්ට අමතරව ප්‍රජාතන්ත්‍රවාදය, සාමය, ක්‍රමවත්භාවය සහ යහපාලනය මත පදනම්ව ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ අනාගතය නිර්මාණය වීමට නම් එම ප්‍රතිසංස්කරණයන් අත්‍යවශ්‍ය වේ.